**ශීර්ෂය 205 - මහා භාරකාර දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂය 205 - මහා භාරකාර දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 නොවැම්බර් 28 දින මහා භාරකාරතැන වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 47.36 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 46.78 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 0.58ක් හෙවත් සියයට 1.22 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2016 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 45.02 | 44.47 | 0.55 | 1.22 |
| මූලධන | 2.34 | 2.31 | 0.03 | 1.28 |
| **එකතුව** | **47.36** | **46.78** | **0.58** | **1.22** |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

### පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 20501 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 2.50 | 2.49 | 1.30 | 2.31 | 10.00 | 6.50 |

## 2.3 විගණන නිරීක්ෂණය

මහා භාරකාර දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

## 3.1 ගිණුම් ඉදිරිපත් කිරීම

2016 වර්ෂය සඳහා භාර බුදල් අවසන් ගිණුම්, 2017 නොවැම්බර් 30 දින වන විටත් සකස් කර නොතිබීම හේතුවෙන් 2016 වර්ෂයට අදාළව භාර බුදල්වල මූල්‍ය තත්ත්වය හා ආදායම් වියදම් තත්ත්වය පිළිබඳ තොරතුරු ලබා ගැනීමට නොහැකි විය.

## 3.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) | පවත්වා නොතිබුණි . |
| (ආ) | ලංසු කැඳවීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 මාර්ගෝපදේශය | පවත්වා නොතිබුණි. |
| (ඇ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1987 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ඈ) | ආයෝජන ලේඛනය | 2006 දෙසැම්බර් 22 දිනැති අංක PF/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.2(ඊ) ඡේදය | යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. |

## 3.3 විගණන විමසුම්වලට පිළිතුරුදීම

දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 3 කට 2017 නොවැම්බර් 30 දින වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එම විමසුම්වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.මිලියන 265.84 ක් වී තිබුණි.

## 3.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

### 3.4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

### 3.4.2 අභ්‍යන්තර විගණනය

අංශ 14 ක් යටතේ ඉටුකළ යුතු කාර්යයන් 67 ක් සඳහා අභ්‍යන්තර විගණනය සැලැස්ම පිළියෙල කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ දී අභ්‍යන්තර විගණන විමසුම් 9 ක් නිකුත් කර තිබුණි. එහෙත් වැදගත් විගණන ක්ෂේත්‍රයන් වූ භාර ගිණුම්වල දැක්වෙන ශේෂයන් තහවුරු කරගැනීම, ආයෝජන ලේඛන හා කොටස් සහතික පරීක්ෂා කිරීම, බැංකු තහවුරු ලබා ගැනීම, නිවැරදිව පොලී හා ලාභාංශ ලැබී ඇති බව හා නිවැරදිව ගිණුම් ගත කර ඇති බවට තහවුරු කර ගැනීම කෙරෙහි අභ්‍යන්තර විගණනයේ අවධානය යොමු කර නොතිබුණි.

## 3.5 අනුකූල නොවීම

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
| --- | --- | --- |
| | රු. | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | | |
| (i) මුදල් රෙගුලාසි 371(1) | 188,000 | අග්‍රිම නිකුත් කළ හැක්කේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන් වෙත පමණක් වුවද පෞද්ගලික ආයතන වෙත අවස්ථා 02 කදී තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 371(2) | 430,580 | කාර්යය නිම කළ වහාම ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළ යුතු වුවත්, අවස්ථා 17 කදී කාර්යය නිමවී මාස 04 කට වැඩි කාල ප්‍රමාදයකින් පසුව අතුරු අග්‍රිමය නිරවුල් කර තිබුණි. |
| (iii) 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 371(2) | 1,180,000 | එක් අවස්ථාවකදී නිකුත් කළ හැකි උපරිම තත් කාර්ය අතුරු අග්‍රිම සීමාව රු.100,000 ක් විය යුතු වුවත්, එම සීමාව අවස්ථා 5 කදී ඉක්මවා තත් කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි. |

## 3.6 කාර්යසාධනය

2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

### 3.6.1 ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම් (අරමුණින් බැහැරවීම් යනාදිය)

දෙපාර්තමේන්තුව සිය අරමුණුවලට අදාළ කාර්යවලින් බැහැරව ක්‍රියා කළ අවස්ථා නිරීක්ෂණය වූ අතර, නියැදි විගණන පරීක්ෂණවලදී එසේ අනාවරණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

#### (අ) ඩී.වී.පී.විජේසිංහ දහම් සෙවණ භාරය

ගල්කිස්සේ පදිංචි ඩී.ජී.ඩබ්. විජේසිංහ මහතා විසින් මහා භාරකාර තැන භාරකරු ලෙස නම් කරමින් රු.25,000 ක ආරම්භක මුදලක් හා පානදුර ප්‍රදේශයේ පිහිටි පර්චස් 37.5 ක ඉඩමක් පවරා 2013 ජනවාරි 31 දින " ඩී.වී.පී.විජේසිංහ දහම් සෙවණ" නමින් භාරයක් පිහිටුවා තිබුණි. මෙහි අරමුණ ලෙස මෙහෙණි සස්නේ චිරස්ථිතිය සඳහා ධර්මායතනයක් පිහිටුවීම සහ එය පවත්වාගෙන යාම සඳහන් කර තිබුණි. එයට අදාළව සිදුකළ විගණන පරීක්ෂණයේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** 2014 දෙසැම්බර් 11 දින මෙම ඉඩම මහා භාරකාර දෙපාර්තමේන්තුව වෙත නීත්‍යානුකූලව පවරා ගෙන තිබුණත්, ඊට ප්‍රථම 2014 ජුනි 18 දින මෙම ඉඩම ඩී.වී.පී විජේසිංහ භාරයට අයත් ඉඩමක් ලෙස දක්වමින් එහි සිල්මාතා ආරාමයක් ඉදිකිරීමට අධිකරණ අවසරය ද ලබා ගෙන තිබුණි. අධිකරණයෙන් අවසරය ලබා ගන්නා අවස්ථාවේදී භාරයට අයත් නොවූ ඉඩමක් භාරය සතු ලෙස දක්වා තිබීම මතභේදාත්මක කරුණක් ලෙස නිරීක්ෂණය විය.

**(ii)** අරමුණු ඉටු කිරීම සඳහා භාරයේ මූලධනය යොදා නොගත යුතු අතර, එහි පොලී මුදල පමණක් භාවිතා කළ යුතු ලෙස භාර ඔප්පුවේ දක්වා තිබුණි. භාරය ආරම්භයේදී මෙම අරමුණු ඉටු කිරීම සඳහා රු.25,000 ක් වූ මූලධනයෙන් ලැබෙන පොලිය ප්‍රමාණවත් ද යන්න පිළිබඳව දෙපාර්තමේන්තුව විසින් අවධානය යොමු කර නොතිබුණි.

**(iii)** භාර ඔප්පුවේ 5 ඡේදය ප්‍රකාරව භාරයේ කටයුතු සම්බන්ධයෙන් අවශ්‍ය මාර්ගෝපදේශ සැපයීම සඳහා භාරයේ ස්ථාපක සභාපති වශයෙන් ඇතුළත්ව 8 දෙනෙකුගෙන් යුතු උපදේශක මණ්ඩලයක් පත්කර තිබුණි. එහෙත් භාරය මගින් සිදුකළ ඉදිකිරීම් වැනි කටයුතුවලදී එම උපදේශක මණ්ඩලය හා එක්ව ක්‍රියාකළ බවට ලිඛිත සාක්ෂි කිසිවක් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

**(iv)** භාර ඔප්පුවේ 21(ආ) ඡේදය සඳහා “මෙය පෞද්ගලික භාරයක්වන බැවින් රජයේ විගණන අංශය මගින් විගණනය කිරීමට යටත් කිරීම ස්ථාපකගේ අභිලාෂය හා අපේක්ෂාව නොවේ” ලෙස වගන්තියක් ඇතුළත් කර තිබීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ දැක්වෙන විධිවිධානවලට අනුකූල ද යන්න ප්‍රශ්ණගත කරුණක් විය.

**(v)** සිල්මාතා ආරාමය ඉදිකිරීමේ කාර්ය සඳහා යූ.ඩී.බී.ද සිල්වා බූදලයෙන් කොපමණ මුදලක් යොදවන්නේද යන්න පිළිබඳ නිශ්චිතව සැලැසුම් කිරීමෙන් තොරව යූ.ඩී.බී.ද සිල්වා බූදලයේ මුදලින් ආරාමය ඉදිකිරීමට අධිකරණ අවසරය ලබා ගෙන තිබුණි.

**(ආ) චාන්දනී හේමන්තා පෙරේරා මෙනෙවියගේ දේපළ කළමනාකරණය**

කොළඹ දිසා අධිකරණයේ අංක 06/2005/ එල්ජී දරන නඩුවේ තීන්දුව මත 2006 ඔක්තෝබර් 04 දිනයේදී චාන්දනී හේමන්තා පෙරේරා මෙනෙවියගේ රෝගී තත්ත්වය සුව වන තුරු, සිවිල් නඩු විධාන සංග්‍රහයේ 39 වන පරිච්ඡේදයේ විධිවිධාන යටතේ ඇගේ බූදලය සඳහා දේපළ ආරක්ෂක වශයෙන් ද පුද්ගල ආරක්ෂක වශයෙන් ද මහා භාරකාර තැන පත්කර තිබුණු අතර ඇගේ නඩත්තුව සඳහා අධිකරණයෙන් නියම කරන මුදලක් වියදම් කිරීමට බලය ලබාදී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** 1922 අංක 01 දරන මහා භාරකාර ආඥාපනත හා ඊට අදාළ සංශෝධන අනුව අධිකරණය මගින් පත් කරන අවස්ථාවල මන්ද මානසික අයගේ දේපළ කළමණාකරුවෙකු ලෙස මහාභාරකාරවරයා කටයුතු කළ යුතුවේ. එහෙත් එවන් පුද්ගලයෙකුගේ පුද්ගල ආරක්ෂක වශයෙන් කටයුතු කිරීමට උක්ත ආඥාපනතින් මහා භාරකාරවරයාට ප්‍රතිපාදන සලසා නොතිබුණි.

**(ii)** මෙම දේපළට අයත් නිවස මහා භාරකාර තැනගේ අවසරයකින් තොරව චාන්දනී හේමන්තා මෙනෙවියගේ ඥාතියෙකු විසින් වෙනත් පුද්ගලයකුට කුලියට දී තිබුණි.

**(iii)** 2014 වර්ෂය සඳහා පිළියෙල කර විගණනයට ඉදිරිපත් කරන ලද භාර අවසාන ගිණුම්වල මෙම භාරයට අදාළ ගිණුම ඇතුළත් කර නොතිබුණි. ඒ අනුව 2014 වර්ෂයේ භාර අවසාන ගිණුම් තුළින් භාර බූදල් පිළිබඳ නිවැරදි තත්ත්වයන් හෙළිදරව් කර නොතිබුණි.

**3.6.2 ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටුනොකර තිබුණු අතර, එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**(අ) යූ.ඩී.බී.ද සිල්වා බූදලය**

2010 අප්‍රේල් 01 දින නැසීගිය යූ.ඩී.බී.ද සිල්වා මහතාගේ 2001 ජුනි 29 දිනැති අංක 10821 දරන අන්තිම කැමති පත්‍රය සහ 2007 අප්‍රේල් 01 දිනැති අංක 99 දරන කොඩිසිල් පත්‍රය මගින් ඒ මහතාගේ බූදලය සඳහා භාරකරු වශයෙන් මහා භාරකාර තැන නම් කර තිබුණි. බණ්ඩාරවෙළ දිසා අධිකරණයේ 2010 සැප්තැම්බර් 08 දිනැති ප්‍රොබේට් බලපත්‍රය මගින් බූදලයේ භාරකාරත්වය හා පාලනය මහා භාරකාර තැන වෙත පැවරී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** බූදලයේ අර්ථලාභීන් ලෙස නම්කර ඇති කාන්තාවන් දෙදෙනෙකු වෙත නිවසක් ඉදිකිරීම සඳහා රු.100,000 ක් ගෙවන ලෙස අන්තිම කැමති පත්‍රයේ සඳහන් කර තිබුණද, එම මුදල ප්‍රමාණවත් නොවීම හේතුවෙන් බූදලයේ මූලධනයෙන් රු.4,500,000 ක් වැය කර නිවසක් මිලදි ගැනීමට බූදලයේ භාරකාර මණ්ඩලය විසින් 2013 සැප්තැම්බර් 28 දිනදී අර්ථලාභීන්ගේ එකඟතාව අනුව තීරණය කර තිබුණි. ඒ අනුව මයිලගස්තැන්න, බදුල්ලෙන් නිවසක් මිලදී ගැනීම සඳහා බණ්ඩාරවෙල මහෙස්ත්‍රාත් අධිකරණයෙන් 2014 ජුනි 18 දින අධිකරණ අවසරය ලබාගෙන තිබුණි. 2016 දෙසැම්බර් 31 දින වන විට

අධිකරණ අවසරය ලබාගෙන වර්ෂ 2 ½ කට ආසන්න කාලයක් ගතවී තිබුණත්, නිවස මිලදී ගෙන නොතිබුණි.

**(ii)** නිවස මිලදී ගැනීමේ කාර්ය සඳහා දෙපාර්තමේන්තුව විසින් අවස්ථා 7 ක දී බූදලයේ මූලධනයෙන් ගමන් ගාස්තු හා නීතිඥ ගාස්තු වශයෙන් එකතුව රු.247,274 ක වියදමක් කර තිබුණත්, එම කාර්ය විගණන දින වන විටත් සිදු කර නොතිබීම නිසා එම වියදම් නිෂ්කාර්ය වී තිබුණි.

**(iii)** යූ.ඩී.බී. ද සිල්වා මහතාගේ අන්තිම කැමති පත්‍රයේ 05 C ඡේදය ප්‍රකාරව බූදල්කරු මියයන අවස්ථාව වන විට හල්දුම්මුල්ල නිවසෙහි පැවති ගෘහ භාණ්ඩ කිහිපයක් සහ මහන යන්ත්‍රය අර්ථලාභිනියක් වන නිවැසි කාන්තාවට ලබාදිය යුතුව තිබුණි. බූදලයේ භාරකරු වශයෙන් හල්දුම්මුල්ල නිවසෙහි පැවති ගෘහ භාණ්ඩ හා උපකරණ පිළිබඳ වාර්තාවක් ලබා ගැනීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කළ බව ලිපිගොනු අනුව තහවුරු නොවුණි. එසේම නිවසෙහි පැවති ගෘහ භාණ්ඩ හා මහන යන්ත්‍රය නිවැසි කාන්තාව වෙත ලබාදුන් බව සනාථ කෙරෙන සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(iv)** මෙම බූදලයට අයත් හල්දුම්මුල්ලේ පිහිටි නිවස සඳහා දෙපාර්තමේන්තුව විසින් ආරක්ෂක විධිවිධාන යොදා නොතිබුණි.

**(v)** දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කර තිබුණු දේපළ ලැයිස්තුවෙහි ඇතුළත් රන් ආභාරණ හා අනෙකුත් වටිනා භාණ්ඩවල වටිනාකම රු.700,000 ක් ලෙස සඳහන් වී තිබුණත් එම භාණ්ඩ පිළිබඳ පිළිගත හැකි තක්සේරු වාර්තාවක් ලබාගෙන නොතිබුණි.

**(vi)** දේපළ ලැයිස්තුව අනුව එක්සත් රාජධානියේ බැංකුවල හා වෙනත් ආයතනවල පැවැති මුදල් වටිනාකම රු.41,079,003 ක් ලෙස සඳහන් වුවත්, ලිපිගොනු පරීක්ෂාවේදී රු.50,179,827 ක තැන්පතු තිබූ බව නිරීක්ෂණය විය. එබැවින් දේපළ ලැයිස්තුව නිවැරදි නොවන බව නිරීක්ෂණය විය.

**(vii)** ආයෝජන ලේඛනය අනුව ස්ථිර තැන්පතුවල ඇති වටිනාකම රු.110,513,662 ක් වුවත්, දෙපාර්තමේන්තු ගොනු අනුව එම වටිනාකම රු.58,000,000 ක් වී තිබුණි. ඒ අනුව රු.52,513,662 ක නොසැසඳු වෙනසක් නිරීක්ෂණය විය.

**(viii)** බූදලයෙන් රු.2,038,430 ක් නීති ගාස්තු වශයෙන් ගෙවා තිබුණු අතර ඉන් රු.1,809,955 ක් දෙපාර්තමේන්තුවේ සේවය කළ නීති නිලධාරී වෙත ගෙවා තිබුණි. එසේම බූදලයේ නීතිමය කටයුතු විගණන දිනය වන විටත් අවසන් කර නොතිබුණු අතර දේපළ තක්සේරු කිරීමටද කටයුතු කර නොතිබුණි.

**(ix)** පුණ්‍යාධාර ලෙස විවිධ පාර්ශවයන් වෙත බූදලයෙන් රු.484,946 ක් වැය කර තිබුණද පුණ්‍යාධාර ගෙවීම්, බූදල්කරුගේ අරමුණු ලෙස දක්වා නොතිබුණි.

**(x)** බූදලයේ පාලනය දෙපාර්තමේන්තුව වෙත පැවරී වර්ෂ 6 ක් ගත වී තිබුණත්, බූදල්කරු විසින් බැංකුවල පවත්වාගෙන ගිය සේප්පු මුදාහැර එහි තිබූ ද්‍රව්‍ය හෝ ලිපි ලේඛන තම භාරයට නොගැනීම නිසා හිඟ සේප්පු ගාස්තු වශයෙන් 2013 හා 2015 වර්ෂවලදී රු.95,986 ක් ගෙවීමට සිදුවී තිබුණි.

**(ආ) සැලැසුම් කිරීම**

මහා භාරකාර දෙපාර්තමේන්තුවේ 2016 ක්‍රියාකාරි සැලැස්මේ 9 ඡේදය ප්‍රකාර භාර/බූදල් දේපළ කළමනාකරණය යටතේ දෙපාර්තමේන්තුවට පැවරී ඇති කෘෂිකාර්මික ඉඩම් 12 විධිමත්ව කළමනාකරණය කර ඒවායේ ආදායමෙන් ස්ථාපකගේ අරමුණු ඉටු කිරීම අපේක්ෂාකර තිබුණි. එම වතුවලින් 2016 වර්ෂයේදී රු.9,784,680 ක ලාභයක් අපේක්ෂා කර තිබුණි. එහෙත් එම අපේක්ෂිත ලාභය ලබා කර ගත් බව සඳහන් කර නොතිබුණු අතර කෘෂිකාර්මික ඉඩම්වලින් ලද ආදායම, 2016 වර්ෂයේ කාර්යසාධන වාර්තාවට ඇතුළත් කර නොතිබුණි.

**3.7 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

දෙපාර්තමේන්තුව විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

**(අ) ගම්පොල නගර සංවර්ධනය හා කසළ බැහැර කිරීමේ කාර්යයට චීන රජයෙන් ලද මුදල්**

ගම්පොල නගර සංවර්ධනය සහ කසළ කළමනාකරණය උදෙසා චීනයේ යුනෑන් පළාතේ ලිංසැන්ග් (Lingsang) නගර සභාවේ නගරාධිපතිවරයා සමඟ ගම්පොල නගර සභාවේ හිටපු නගරාධිපතිවරයා 2011 ජුලි 07 දින ගිවිසුමක් අත්සන් කර තිබුණි. එම ගිවිසුමේ දැක්වෙන අරමුණු 14 ක් ඉටුකර ගැනීම සඳහා යුආන් මිලියනයක ප්‍රදානයක් ලබාදීමට එමගින් එකඟ වී තිබුණි. ඒ අනුව 2012 ඔක්තෝබර් 19 දින ඇමරිකන් ඩොලර් 159,604.18 හෙවත් රු.20,426,675 ක් ලංකා බැංකුවේ ටොරින්ටන් ශාඛාවේ මහා භාරකාර තැනගේ නිල බැංකු ගිණුමට ඒවා තිබුණි. එම මුදලින් මහා භාරකාර තැන විසින් රු.20,814,322 ක් විවිධ කාර්යයන් සඳහා වියදම් කර තිබුණි. එයට අදාළව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** 1918 අංක 1 හා 1918 අංක 4 දරන පනත් මගින් සංශෝධිත 1917 අංක 9 දරන භාර ආඥා පනත මගින් ද, 1931 අංක 11, 1938 අංක 59 හා 1983 අංක 41 දරන පනත් මගින් සංශෝධිත 1922 අංක 1 දරන මහා භාරකාර ආඥාපණතේ දැක්වෙන මහා භාරකරුගේ කාර්යභාරයන් අතරට මෙවැනි නගර සංවර්ධන ව්‍යාපෘතිවලට සම්බන්ධ වීමට ඉඩකඩක් නොතිබුණි.

**(ii)** මුදල් රෙගුලාසි 610 හා 2011 අප්‍රේල් 21 දිනැති අංක MOFP/ERD/2011/01 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව විදේශ රාජ්‍යයන්ගෙන් මූල්‍යාධාර ලබාගැනීමේදී විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නියමයන් අනුගමනය කළ යුතුව තිබුණි. නමුත් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය හෝ එකඟතාවය ලබා නොගෙන රටවල් දෙකක නගරාධිපතිවරු දෙදෙනෙක් සමඟ අන්තර්ජාතික ගිවිසුමක අතරමැදියෙකු ලෙස කටයුතු කර තිබුණි.

**(iii)** ගම්පොල නගර සභාවේ සංවර්ධන කටයුතු සඳහා යෙදවිය යුතු මුදලක් එම නගර සභාවේ එවකට හිටපු සභාපතිවරයෙකුගේ නමින් ලබාගෙන මතභේදාත්මක ගනුදෙනුවක් සිදු කර තිබුණි.

**(iv)** සංවර්ධන කටයුතු සඳහා පවරාගත් ඉඩම් වෙනුවෙන් වන්දි ගෙවීම සඳහා රු.මිලියන 8 ක් ගම්පොල නගර සංවර්ධන භාරය වෙත ගෙවා තිබුණද, එවැනි වන්දි පිරිනැමීමක් සිදු කළ බව සනාථ කර ගෙන නොතිබුණි.

**(v)** ගම්පොල නගර සංවර්ධන භාරයෙන් රු.මිලියනයක් 2014 වර්ෂයේ වෙසක් කළාපයේ සැරසිලි වියදම් සඳහා ලබා ගෙන තිබුණි. එම චීන රජයෙන් මුදල් ලබාදුන් අරමුණට පටහැනිව සිදු කළ වියදමක් ලෙස නිරීක්ෂණය විය.

**(vi)** ගම්පොල නගර සභා බල ප්‍රදේශයෙන් පිට පුස්සැල්ලැව ප්‍රදේශයේ සාප්පු සංකීර්ණයක් ඉදිකිරීම සඳහා රු. 10,000,000 ක් මහනුවර නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගෙවා තිබුණි. සාප්පු සංකීර්ණයක් ඉදිකළ බව තහවුරු කරගෙන ද නොතිබුණි.

**(vii)** ගම්පොල නගර සභා බල ප්‍රදේශයෙන් පිට පුස්සැල්ලැව ප්‍රදේශයේ බස්නැවතුම්පල අවට සංවර්ධනය සඳහා ගම්පොල නගර සංවර්ධන භාරයට රු.1,200,000 ක් ගෙවා තිබුණි. බස් නැවතුම්පල සංවර්ධනය කළ බවට තහවුරු කර ගෙන ද නොතිබුණි.

**(viii)** ගම්පොල නගර සංවර්ධන භාරයට අයත් ලංකා බැංකුවේ පිළියන්දල ශාඛාවේ පුද්ගලයින් තිදෙනෙකු නමින් පවත්වාගෙන යනු ලබන පෞද්ගලික හවුල් ජංගම ගිණුමකට ඉහත (iv), (v) හා (vii) යන ඡේදවල සඳහන් නිරීක්ෂණවල දැක්වෙන එකතුව රු.මිලියන 10.20 ක් බැර කර තිබුණු බව තහවුරු වී තිබුණි. ඒ අනුව රජයේ මුදල් පෞද්ගලික ගිණුමකට බැරකිරීමට නීතිමය විධිවිධානයක් සලසා නොතිබුණි. .

**(ix)** ගම්පොල නගර සභාව සංවර්ධනය වෙනුවෙන් චීන රජයෙන් ලද මුදල උපයෝජනය සඳහා 2012 ජුලි 20 දින ගඟසිරිපුර ඩිවලප්මන්ට් ට්‍රස්ට් නම් වූ අංක අයිඕ/28/2012 දරන භාරය සඳහා පෞද්ගලික පාර්ශවයක් ස්ථාපක ලෙසත්, මහා භාරකාර තැන ආරක්ෂක භාරකරු ලෙසත් නම් කරමින් පිහිටුවා තිබුණි. තවද පුද්ගලයින් 07 දෙනෙකුගෙන් යුත් භාර කළමනාකරණ කමිටුවක්ද පත්කර තිබුණි. මේ අතරට ගම්පොල නගර සභාවේ කිසිදු මන්ත්‍රීවරයෙක් හෝ නිලධාරියෙක් ඇතුළත් කරගෙන නොතිබුණි. ඒ අනුව ගඟසිරිපුර නගර සංවර්ධන භාරය ගම්පොල නගරය සංවර්ධනය සඳහා පිහිටුවා තිබුණු බව නිරීක්ෂණය නොවූ අතර එවැනි භාරයක් යටතේ රු.20,200,000 ක් වියදම් කිරීම මතභේදාත්මක බව නිරීක්ෂණය විය.

**(x)** ගම්පොල නගර සංවර්ධන භාරය විසින් ලංකා බැංකුවේ පිළියන්දල ශාඛාවේ ගම්පොල නගර සංවර්ධන භාරය නමින් ස්ථාවර තැන්පතු ගිණුමක රු.ලක්ෂ 80 ක් තැන්පත් කර තිබුණු බව නිරීක්ෂණය විය. එබැවින් චීන රජයෙන් ලැබී තිබුණු මුදල් සම්බන්ධයෙන් යම් අවභාවිතාවක් සිදු වී නොතිබුණු බව තහවුරු කිරීමට ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ) සිසිල් අර්නස්ට් වනිගසූරිය මහතාගේ බූදලය සම්බන්ධයෙන් වූ විගණනය**

-----------------------------------------------------------------------

අංක 1503 දරන අන්තිම කැමති පත්‍රය හා අංක 1799 දරන කොඩිසිල් පත්‍රය මගින් සිය දේපළ සම්බන්ධයෙන් මහා භාරකාරවරයා භාරකාරු ලෙස පත්කර අන්තිම කැමති පත්‍රයේ අරමුණු ඉටු කිරීම සඳහා "සිසිල් වනිගසූරිය භාරය " නමින් භාරයක් පිහිටුවා පවත්වාගෙන යන ලෙස දක්වා, 1999 නොවැම්බර් 28 දින මියගිය කොළඹ 6 හි පදිංචි සිසිල් අර්නස්ට් වනිගසූරිය මහතාගේ

බූදලය මහා භාරකාර තැනට පවරා තිබුණි. දේපළ විකුණා ලැබෙන සියලු මුදල් "සිසිල් වනිගසූරිය " නමින් භාරයක් විවෘත කර එහි තැන්පත් කළ යුතුව තිබුණි. එසේම එම භාරය මගින් අන්තිම කැමති පත්‍රයේ සඳහන් අධ්‍යාපනික ආධාර, පුන්‍ය කටයුතු සඳහා ආධාර වෛද්‍ය ආධාර ගෙවීම වැනි අරමුණු ඉටු කිරීම මහා භාරකාරවරයා වෙත පැවරී තිබුණි. ඉහත නිශ්චල දේපළ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** 1999 නොවැම්බර් 23 දිනැති අංක 1799 දරන කොඩිසිල් පත්‍රය ප්‍රකාර වැල්ලවත්ත දුම්රියපල පටුමගේ වූ ඉඩම් හා දේපළ මහා භාරකාර දෙපාර්තමේන්තුව වෙත පවරා වර්ෂ 6 ක කාලයක් ගත වීමෙන් පසුව එම දේපල රු.මිලියන 79 කට විකුණා තිබුණි. දේපළ විකුණා වර්ෂ 4 ක් ඉක්මවා තිබුණත්, භාරය නමින් එම මුදල් ආයෝජනය නොකර දෙපාර්තමේන්තු නිල බැංකු ගිණුමේ තැන්පත් කර තිබුණි. ඒ අනුව විගණන දින වන විට දේපළ දෙපාර්තමේන්තුවට පැවරී වර්ෂ 10 ක් ඉක්මගොස් ඇතත්, බූදල්කරුගේ අන්තිම කැමති පත්‍රයේ අරමුණු ඉටු කිරීම සඳහා මෙම දේපළ විකිණීමෙන් ලද මුදල් උපයෝජනය කර නොතිබුණි.

**(ii)** සිසිල් අර්නස්ට් වනිගසූරිය මහතාගේ බූදලයට ඇතුළත් කොලොන්නාව නගර සභා සීමාව තුළ පිහිටි සේදවත්තේ අක්කර 3, රූඩ් 2, පර්චස් 10.81 ක් වූ ඉඩම, අංක 1711 දරන ඔප්පුව මගින් නැසීගිය සී.ඊ් වනිගසූරිය මහතා විසින් 1997 සැප්තැම්බර් 26 දින දී විකුණා ඇති බව ලිපිගොනුවෙන් සනාථ වී තිබුණි. අන්තිම කැමති පත්‍රයට ඇතුළත් දේපළක් විකිණීම හා එසේ විකුණා ලබා ගත් මුදලින් සිදු කළ කාර්යයන් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(iii)** අන්තිම කැමති පත්‍රයේ සඳහන් දේපළවලට අමතරව නැසී ගිය සී.ඊ්.වනිගසූරිය මහතාට අයත්ව සේදවත්තේ පැවැති හිස් ඉඩමක් රු.9,043,935 කට විකුණා ලද මුදල් අංක 1210/00T දරන නඩුවේ දේපල ලැයිස්තුවේ දක්වා තිබුණි. එහෙත් එම මුදල් දෙපාර්තමේන්තුවට ලැබීම හා සිසිල් වනිගසූරිය බූදල් ගිණුමට ගිණුම්ගත කිරීම පිළිබඳ තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

**(iv)** සී.ඊ්. වනිගසූරිය මහතා මිය යාමට පෙර කොටස් දෙකක් යටතේ කට්ටි කර සැලැසුම් සකස් කර විකිණීම සඳහා, කඩවත, පෞද්ගලික වෙන්දේසි කරුවකුට භාරදී තිබූ කඩවත, මිරිස්වත්තේ, ඌරලිංකනත්ත නැමති ඉඩමේ නොවිකිණී ඉතිරි වූ අක්කර 01 රූඩ් 4 පර්චස් 38 ක ඉඩම් ප්‍රමාණය අන්තිම කැමති පත්‍රය අනුව නැවත විකුණා එම මුදල් භාරය නමින් තැන්පත් කළ යුතුව තිබුණි. එහෙත් 2009 ජුනි 02 දින ගල්කිස්ස දිසා අධිකරණයෙන් ලබාගත් අවසරය පිට අංක 778 A දරන මානක සැලැස්මේ නොවිකිණී ඉතිරි වූ අක්කර 01 රූඩ් 2 පර්චස් 24 ක ඉඩම් ප්‍රමාණයක් රණවිරුවන් වෙත ප්‍රදානය කිරීම සඳහා රාජ්‍ය ආරක්ෂාව, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය වෙත පවරා දී තිබුණි. මෙලෙස ඉඩම් පවාරදීම බූදල්කරුගේ අරමුණුවලට එකඟ බන බව තහවුරු කිරීමට ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(v)** විකිණීම සඳහා භාරදුන් එකතුව පර්චස් 30 ක් වූ 152/1988 අංක දරන මානක සැලැස්මෙ කැබලි අංක 3 හා කැබලි අංක 4 ද, 778/A මානක සැලැස්මේ ගල කොටස ලෙස සඳහන් පර්චස් 64 ක් වූ කොටස ද තවදුරටත් ඉතිරිව තිබූ නමුත් එම බිම් කොටස් 3 විකුණා මුදල් බූදලයට බැර කිරීමට කටයුතු කර ඇති බව සනාථ කිරීමට අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(vi) අන්තිම කැමති පත්‍රයේ 5(iii) හා (iv) ඡේද යටතේ වූ සහ කොළඹ දිසා අධිකරණයේ අංක 33485/T දරන නඩුවේ තීන්දුව මත නිකුත් කළ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය මගින් නැසීගිය සී.ඊ් වනිගසූරිය මහතාට හිමි වූ, ස්ථාන 4 ක පිහිටි එකතුව අක්කර 03 රූඩ් 03 පර්චස් 8 ක් ද, ස්ථාන 02 ක පිහිටි, ප්‍රමාණය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිශ්චය කර නොතිබුණු දේපළ ද, කොලොන්නාව නගර සභා සීමාව තුළ පිහිටි සේදවත්තේ පැවැති ඉඩම් සම්බන්ධයෙන්ද ප්‍රොබේට් බලපත්‍රය ලැබී වර්ෂ 11 ක් ගත වී තිබුණි. නමුත් එම දේපළ විකුණා මුදල් සිසිල් වනිගසූරිය භාරයට බැර කිරීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර තිබුණු බව තහවුරු කර නොතිබුණි. .

(vii) 2007 දෙසැම්බර් 31 දිනට සී.ඊ් වනිගසූරිය බූදලය සඳහා මහා භාරකාර තැන විසින් පිළියෙල කළ ශේෂපත්‍රයෙහි එදිනට මුළු වත්කම් රු.98,182,155 ක් ලෙස ද දක්වා තිබුණි. එහෙත් තක්සේරු කරන ලද දේපළ ලැයිස්තුව අනුව මුළු වත්කම් වල අගය රු.111,246,658 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව ඉහත දේපළ ලැයිස්තුවේ සඳහන් වටිනාකම් හා 2007 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර ගොණු ගත කර තිබූ ශේෂපත්‍රයේ සඳහන් අගයයන් අතර රු.13,064,503 නොසැසඳු වෙනසක් නිරීක්ෂණය විය.

(viii) අන්තිම කැමති පත්‍රයේ 9 ඡේදයේ දක්වා ඇති පරිදි ලන්ඩනයේ පිහිටි බැංකු දෙකක සී.ඊ්. වනිගසූරිය මහතා නමින් පැවැති ගිණුම්වල මුදල් සී.ඊ්. වනිගසූරිය බූදලය වෙත ලබා ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. ඒ හේතුව මත අන්තිම කැමති පත්‍රයේ 9 ඡේදයෙන් අපේක්ෂිත, එම මුදල් ලන්ඩනයේ බෞද්ධ විහාරයේ මහා බෝධි සංගමයට ලබාදීමේ අරමුණ සමාලෝචිත වර්ෂය වන විටත් දෙපාර්තමේන්තුව විසින් ඉටු කර නොතිබුණි. එසේම සී.ඊ් වනිගසූරිය බූදලයට අයත් සියලුම දේශීය හා විදේශීය බැංකු ගිණුම් හදුනාගත් බවට හා සියලුම දේශීය හා විදේශීය බැංකු ගිණුම්වල පැවති මුදල් අදාළ පොලී මුදල් සමග සී.ඊ් වනිගසූරිය බූදලය නමින් ගිණුම් ගත කර තිබුණු බව තහවුරු කිරීමට අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ix) 2007 අගෝස්තු මාසයේදී පිළියෙල කර තිබුණු දෙපළ ලැයිස්තුව ප්‍රකාරව සී.ඊ්.වනිගසූරිය බූදලය සතුව රු.683,950 ක් වටිනා ගෘහභාණ්ඩ හදුනාගෙන තිබුණි. දෙපාර්තමේන්තුව විසින් නිසි අවධානයක් හා සැලකිල්ලක් නොදැක්වීම මත ගෘහ භාණ්ඩ හා ගෘහ උපකරණ දිරාපත් වී අගය අඩුවීමකට ලක් වී තිබුණි .

**(ඇ) සෙනෙවිරත්න වෛද්‍යාධාර අරමුදල් භාරය**

2015 වර්ෂයට පෙර මහා භාරකාර ධූරය දැරූ අය භාරකරු ලෙස නම් කරමින් එම මහතාගේ බිරිඳ විසින් රු.25,000 ක මූලධනයක් යොදවමින් 2013 දෙසැම්බර් 31 දින සෙනෙවිරත්න වෛද්‍යාධාර අරමුදල් භාරය නමින් භාරයක් පිහිටුවා තිබුණි. එම භාරයේ අරමුණු ලෙස එම මහා භාරකාරවරයාට වෛද්‍ය ප්‍රතිකාර අවශ්‍ය වූ අවස්ථා වලදී මූල්‍ය පහසුකම් සැලසීම, මහා භාරකාර දෙපාර්තමේන්තුවේ පිහිටුවා ඇති සමාජසේවා සහ පොදු අරමුදල් භාරයේ භාර අරමුණුවලට අනුකූලව සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් වෛද්‍ය පහසුකම් සඳහා ගෙවා තිබුණු හා ඉදිරියටත් ගෙවීමට සිදුවිය හැකි රෝහල් බිල්පත් සඳහා වැය කරන ලද මුදල් ප්‍රතිපූර්ණය කිරීම හා මහාභාරකාරවරයාගේ දෙමාපියන් වෙනුවෙන් වාර්ෂිකව පිංකම් කර ඔවුනට පිං පැමිණවීම යනාදිය දක්වා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට මෙම භාරයෙන් රු.3,569,712 ක් හා අනෙකුත් භාර බූදල් සතු මුදල් වලින් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** මහා භාරකාර දෙපාර්තමේන්තුවේ ඇති සමාජසේවා සහ පොදු අරමුදල් භාරය මගින් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සෙනවිරත්න මහතාගේ වෛද්‍ය පහසුකම් සඳහා ගෙවා තිබුණු හා ඉදිරියටත් ගෙවීමට සිදු විය හැකි රෝහල් බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම මෙම භාරය පිහිටුවීමේ අරමුණ ලෙස භාර ඔප්පුවේ 6(ආ) හා 12(ඇ) වගන්තිවල දක්වා තිබුණි. නමුත් සමාජසේවා සහ පොදු අරමුදල් භාරයෙන් සෙනවිරත්න මහතාගේ වෛද්‍ය පහසුකම් සඳහා ගෙවා තිබුණු කිසිදු රෝහල් බිල්පතක් මෙම භාරය මගින් ප්‍රතිපූර්ණය කර නොතිබුණි. එසේම උක්ත භාරය පිහිටුවීමට පෙර හා පසුව මහා භාරකාර දෙපාර්තමේන්තුවේ "සමාජසේවා හා පොදු අරමුදල් භාරයෙන්" එන්.එස්.ඒ.එස් සෙනෙවිරත්න මහතා වෙනුවෙන් වෛද්‍ය බිල් පියවීම සම්බන්ධව දෙපාර්තමේන්තුව විසින් වාර්තා තබාගෙන නොතිබුණි.

**(ii)** භාර ඔප්පුවේ 16 වන වගන්තිය ප්‍රකාරව මූලධනයට ලැබෙන පොලී ආදායමෙන් සියයට 25 ක් නැවත ආයෝජනය කළයුතු බව දක්වා තිබුණි. භාරය වෙනුවෙන් රු.1,500,000 ක ස්ථාවර තැන්පතුවක් ස්ථාපක විසින් මූලධනය ලෙස 2014 ජනවාරි 21 දින තැන්පත් කළ ද, 2014 ජූලි වන විට එහි පොලී ආදායම් හා මූලධනය ඉක්මවා රු.1,069,712 ක් වියදම් කර තිබුණි.

**(iii)** "මෙය පෞද්ගලික භාරයක් බැවින් රජයේ විගණන අංශය මගින් විගණනය කිරීමට යටත් කිරීම ස්ථාපකගේ අභිලාෂය හා අපේක්ෂාව නොවේ" යනුවෙන් භාර ඔප්පුවේ 18 (ඇ) වගන්තියේ සටහන් කිරීම මගින් විගණන විෂය පතය සීමා කර ඇති බවක් නිරීක්ෂණය විය.

**(iv)** එවකට සිටි මහා භාරකාර තැනගේ වෛද්‍ය වියදම් පියවීම සඳහා ඔහුගේ භාර්යාව ස්ථාපක වශයෙන් ඉදිරිපත් වී ආරම්භ කර තිබුණු මෙම භාරය මගින් මහා භාරකාරවරයා විසින් තම වෛද්‍ය බිල්පත් පියවීම සඳහා මූලධනය ඉක්මවා යන පරිදි අනුමැතියකින් තොරව වියදම් කර තිබුණු බව නිරීක්ෂණය විය.

**(ඇ)** **ෆ්ලොරන්ස් ඊනිඩ් විදම් මහත්මියගේ බූදලය**

---

1968 අගෝස්තු 11 දින සිංගප්පූරුවේදී මියගිය ෆ්ලොරන්ස් ඊනිඩ් විදම් මහත්මිය විසින් ශ්‍රී ලංකාවේ ස්ථාන 3 ක පිහිටි එකතුව රූඩ් 3 පර්චස් 35.8 ක ඉඩම් හා එම ඉඩම්වල පිහිටි නිවාස ගොඩනැගිලි 3 ක් විකුණා ලැබෙන මුදල් ද පෞද්ගලික බැංකුවක පැවැති රු.54,476 ක මුදල ද උරුමකරුවන්ට /අර්ථලාභීන්ට ලබාදීම සඳහා ඇටර්නි බලකරු ලෙස ශ්‍රී ලංකා මහා භාරකාරවරයාව 1975 වර්ෂයේ දී නම් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** කොළඹ 05 හි පිහිටි රූඩ් 01 පර්චස් 5 ක ඉඩම හා නිවස විකිණීම සඳහා 2004 සැප්තැම්බර් 27 දින පුවත්පත් දැන්වීම් මගින් ටෙන්ඩර් කැඳවා තිබුණි. ටෙන්ඩර් දැන්වීම පළකරන අවස්ථාව වන විට උරුමකරුවකු දේපළෙහි පදිංචිව සිටි අතර, පදිංචිකරුවන් ඉවත්කර නිරවුල් අයිතිය ලබාගැනීම ටෙන්ඩර්කරුගේ වගකීම වන බවත්, ඒ සම්බන්ධයෙන් මහා භාරකාර දෙපාර්තමේන්තුව වග නොකියන බවත් ටෙන්ඩර් දැන්වීමේ දක්වා තිබුණි.

**(ii)** මෙම දේපළ විකිණීම සඳහා පත්කළ ටෙන්ඩර් මණ්ඩලයේ සියලුම සාමාජිකයන් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් වීම හේතුවෙන් ටෙන්ඩර් මණ්ඩල සංයුතිය හා විනිවිදභාවය පිළිබඳව ප්‍රශ්ණගත විය.

**(iii)** මේ සඳහා ටෙන්ඩර්කරුවන් 04 දෙනෙකු මිල ගණන් ඉදිරිපත් කර තිබුණු අතර මහා භාරකාරවරයා, මුදල් අධ්‍යක්ෂ, පරිපාලන නිලධාරී, භාරනිලධාරී යනාදී මහා භාරකාර දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 04 දෙනෙකුගෙන් සැදුම්ලත් ටෙන්ඩර් මණ්ඩලයක් මගින් ටෙන්ඩර් විවෘත කිරීම හා ටෙන්ඩර් ඇගයීම සිදුකර රු.50,511,000 ක් වූ වැඩිම මිල ඉදිරිපත් කළ ටෙන්ඩර්කරුට 2004 ඔක්තෝබර් 22 දින දී ටෙන්ඩර් ප්‍රදානය කර තිබුණි. අත්තිකාරම් වශයෙන් රු.1,000,000 ක් දින 14 ඇතුළත ගෙවීමෙන් පසු ඉඩම පැවරීම සඳහා කටයුතු කරන බව පමණක් ටෙන්ඩර් ප්‍රදාන ලිපියේ දක්වා තිබුණි. මේ සඳහා ගැණුම්කරු සමග දේපළ විකිණීමේ ගිවිසුමකට එළඹ නොතිබුණි.

**(iv)** විකුණුම් කළ දේපළ සඳහා මුදල් ගෙවීම ටෙන්ඩර් ලාභියා විසින් පැහැර හැර තිබූ අතර වර්ෂ 06 ක පමණ දීර්ඝ කාලයක් මුළුල්ලේ වර්ෂයට වරක් බැගින් අවස්ථා 06 ක දී මුදල් ගෙවීම් සඳහා කල් ඉල්ලීම කර තිබුණි. එම සියලුම කල් ඉල්ලීම් සඳහා හිටපු මහා භාරකාරවරයා විසින් අනුමැතිය ලබා දී ටෙන්ඩරය අවලංගු නොවීමට කටයුතු කිරීම හා මුදල් ගෙවීම දීර්ඝ කාලීනව ප්‍රමාද කිරීමට අවකාශ සලසා දී තිබුණි.

**(v)** ගෙවීම් කටයුතු සඳහා ගතකළ කාලය අතරතුර දී එනම් 2007 මාර්තු 15 දින දී ටෙන්ඩර් ලාභියා විසින් මහා භාරකාරවරයා වෙත ලිපියක් ඉදිරිපත් කර , පර්චස් 01 ක් රු. 1,800,000 බැගින් පර්චස් 38.37 ක් වූ මුළු දේපළ රු.69,066,000 ක මුදලකට මිලදී ගැනීමට කැමති බව දන්වා නැවත මිල ගණන් ඉදිරිපත් කර තිබූ අතර, එම කාලය තුළ දී මෙම දේපළ මිලදී ගැනීමට තවත් ගැනුම්කරුවන් 05 දෙනෙකු ලිපි මගින් ටෙන්ඩර් ලාභියාගේ මිල ගණන්වලට වඩා වැඩි මිල ගණන් ඉදිරිපත් කර තිබුණි.

**(vi)** ටෙන්ඩර්ලාභියා විසින් ඉදිරිපත් කළ ටෙන්ඩර් මිල ගණන් හා පසුව ලිපියකින් ඔහු ඉදිරිපත් කළ මිල ගණන් පිළිබඳව එකඟ නොවන බවත්, මෙම දේපළ එම මිලට වැඩියෙන් වටිනා බවත්, දැනට ඉදිරිපත් කළ වැඩිම මිල ගණන් අනුව රු.77,123,700 කට අවම වශයෙන් විකිණිය හැකි බවත් දේපළෙහි උරුමකරුවන් විසින් හිටපු මහා භාරකාරවරයාට නියෝජන ඉදිරිපත් කර තිබුණද, ඔහු ඊට කිසිදු ප්‍රතිචාරයක් දක්වා නොතිබුණි.

**(vii)** මෙම ගැටළුකාරී තත්ත්වය සම්බන්ධයෙන් 2007 ජුලි 31 දින නීතිපතිවරයාගේ උපදෙස් ඉල්ලා තිබුණි. ටෙන්ඩර්ලාභියා මුදල් ගෙවීමට අපොහොසත් වීම නිසා ඒ සඳහා කල් ලබාදී තිබුණද, ගෙවීම් නොකිරීමත් හා නැවත වැඩි මිල ගණන් ඉදිරිපත් කිරීම තුළින් කලින් ඉදිරිපත් කළ මිල ගණන් අවලංගු වී තිබුණු බවත්, ඔහු විසින් ඉදිරිපත් කළ නව මිල ගණන් පිළිගෙන නොමැති වීම මත ඔහුට දේපළ විකිණීම සඳහා එකඟතාවයක් නොමැති බවත්, ඉහළ මිලකට දේපළ විකිණීමට කටයුතු කර මෙහි උරුමකරුවන්ට වැඩි ප්‍රතිලාභ ලැබෙන පරිදි කටයුතු කළ යුතු බවට නිතිපතිවරයා විසින් උපදෙස් ලබා දී තිබුණි. තවද මේ සම්බන්ධයෙන් ප්‍රධාන වශයෙන් කොළඹ දිස්ත්‍රික් අධිකරණයට කරුණු ඉදිරිපත් කරන ලෙස හිටපු මහා භාරකාරවරයාට අවවාද කර තිබුණි. ඒ අනුව හිටපු මහා භාරකාරවරයා විසින් කොළඹ දිසා අධිකරණයට 2008 සැප්තැම්බර් 17 දින පෙත්සමක් මගින් තක්සේරු වාර්තාවේ සඳහන් මිලට වඩා වැඩි මිලකට එනම් රු.69,066,000 කට මිලදී ගැනීමට ටෙන්ඩර්කරු එකඟ වී ඇති බවත්, එම මිල ගණන් ඉදිරිපත් කළ උපරිම මිල බවටත් තොරතුරු ඉදිරිපත් කර තිබුණි. ගැනුම්කරුවන් 04 දෙනෙකු විසින් පසුව ඉදිරිපත් කළ ඉහළ මිල ගණන් පිළිබඳව කරුණු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් අදාළ දේපළ රු.69,066,000 ක මුදලකට ටෙන්ඩර්ලාභියාට විකිණීමට දිසා අධිකරණයේ අනුමැතිය ලබාදී තිබුණි.

**(viii)** මෙම දේපළ විකිණීමෙන් ලැබුණු රු.69,066,000 කින් රු.25,615,209 ක් උරුමකරුවන් හා අර්ථලාභීන් 20 දෙනෙකුට ලබා දී තිබුණි. මුදල් ලැබූ අර්ථලාභීන් මෙම දේපළේ නිවැරදි උරුමකරුවන් බව සනාථ කිරීමේ සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. මෙම දේපලේ ඇටර්නි බලකරු ලෙස මහා භාරකාරවරයා නම්කර ඇති අවස්ථාවේ එනම් 1975 වර්ෂයේ දී දේපළ සඳහා උරුමකරුවන් 08 දෙනෙකු පමණක් සිටිය ද දීර්ඝ ලෙස කල් ගත වීම මත දැනට හඳුනාගත් පරිදි උරුමකරුවන් 46 දෙනෙකු දක්වා වැඩි වී තිබුණි. ඒ අනුව මුදල් ගෙවීමේදී එම කරුණු සැලකිල්ලට ගත යුතුව තිබුණු බව නිරීක්ෂණය විය.

**(ix)** දේපළ විකිණීමෙන් ලද මුදලින් අර්ථලාභීන් 20 දෙනෙකුට ගෙවා ඉතිරි වූ රු.43,450,791 ක් වූ මුදල 2016 ජනවාරි 31 දින වන විට වර්ෂ 5 කට වැඩි කාලයක් ඉකුත් වී තිබුණ ද අනෙක් උරුමකරුවන්ට / අර්ථලාභීන්ට ගෙවා නොතිබුණි. ඒ සඳහා හේතු විගණනයට පැහැදිලි කර නොතිබුණි.

**(x)** මෙම නොගෙවූ මුදල් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීම දෙපාර්තමේන්තුව තුළ ක්‍රියාත්මකව පැවති පිළිවෙත වුවත්, 2015 ජුනි 02 දින රු.1,000,000 ක මුදලක් පමණක්, එසේ ආයෝජනය කර තිබුණි.

**(xi)** දේපළ විකිණීමෙන් ලද මුදල් අයෝජනය නොකිරීම නිසා බැංකු ගිණුම්වල තිබිය යුතු නමුත් එසේ නොමැතිව වෙනත් භාර අරමුදල්වල හා බූදල්වල ගෙවීම් සඳහා එම මුදල් උපයෝජනය කර තිබුණි.

**(xii)** කොළඹ 05 ක්ලාසන් පෙදෙස, පිහිටි රූඩ් 01, පර්චස් 05.94 ක වර්ග ප්‍රමාණයකින් යුත් දේපළ විකිණීමේ කටයුතු 2016 දෙසැම්බර් 31 දින වන විටත්, ආරම්භ කර නොතිබුණි. එදින වන විට මෙම දේපළ විකිණීම සඳහා වර්ෂ 40 කට අධික දීර්ඝ කාලයක් ගතකර තිබුණි.

**(xiii)** ඉඩම විකිණීමට ප්‍රථම දේපළෙහි වටිනාකම තහවුරු කර ගැනීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් රජයේ තක්සේරු වාර්තාවක් ලබාගැනීමට කටයුතු කළ යුතුව තිබුණද, එසේ සිදු කර නොතිබුණි.

**3.8 අවිධිමත් ගනුදෙනු**

----------------------

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**(අ) ආගමික සමාජ සේවා හා පොදු භාර අරමුදල පිහිටුවීම හා වියදම් කිරීම**

----------------------------------------------------------------------

අග්‍රාමාත්‍යවරයා හා අදාළ රේඛීය අමාත්‍යවරයා විසින් මහා භාරකාර දෙපාර්තමේන්තුවේ කටයුතු පරීක්ෂා කිරීම සඳහා 2005 පෙබරවාරි 17 දින ත්‍රි පුද්ගල කමිටුවක් පත්කර තිබුණි. එම කමිටුව විසින් "පොදු ආයෝජන ගිණුමට" නීතිමය පදනමක් ලබාදිය යුතු බවට නිර්දේශ ඉදිරිපත් කර තිබුණි. එහෙත් ''ආගමික හා සමාජසේවා පොදු භාර අරමුදල'' නමින් වෙනමම අරමුදලක් පිහිටුවීමට අනුමැතිය ලබාගැනිම සඳහා 2010 පෙබරවාරි 16 දින මහා භාරකාරවරයා විසින් කොළඹ දිසා අධිකරණයේ පෙත්සමක් ගොනුකර තිබුණි. එම දිනයෙන් පසුව ද භාර ඔප්පුවේ සඳහන් කරුණුවලට සංශෝධනයන් ඉදිරිපත් කර තිබූ අතර, ඒ සඳහා කොළඹ දිසා විනිසුරු විසින් 2010 ජුලි 16 හා 2010 අගෝස්තු 11 දිනයන්හි දී අවසර ලබාදී තිබුණි. දෙපාර්තමේන්තුවේ පැවතුණ

"පොදු ආයෝජන පොලී ගිණුමෙන්" රු.මිලියන 10 ක් ලබා ගෙන ආගමික හා සමාජ සේවා පොදු භාර අරමුදල 2010 වර්ෂයේ දී, ආරම්භ කර තිබුණි. මේ සම්බන්ධව සිදුකළ විගණන පරීක්ෂාවේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

**(i)** අග්‍රාමාත්‍යවරයා විසින් පත්කරනු ලැබූ ත්‍රි පුද්ගල කමිටුවේ නිර්දේශ අංක 02 අනුව පොදු ආයෝජන ගිණුමක් ඇති කිරීමට රීතියක් ඇතුළත් කිරීම හෝ ඊටත් වඩා නීතිමය බලතල අවශ්‍ය වේ නම්, ප්‍රධාන පනතට වගන්තියක් එකතු කිරීම සඳහා නීතිපතිගේ උපදෙස් ලබාගැනීමට යෝජනා කර තිබුණ ද, කමිටුවේ යෝජනාවට අනුව කටයුතු නොකර පොදු ආයෝජන ගිණුමට නීතිමය පදනමක් ලබාදිය යුතු බවට කමිටුව නිර්දේශ කර තිබුණත්, හිටපු මහා භාරකාර තැන විසින් එසේ කටයුතු නොකර ආගමික හා සමාජ සේවා පොදු භාර අරමුදල නමින් වෙනමම අරමුදලක් පිහිටුවීමට අවසර ඉල්ලමින් කොළඹ දිසා අධිකරණයට පෙත්සමක් ගොනු කර තිබුණි.

**(ii)** මහා භාරකාර ආඥා පනතේ 39 වන වගන්තිය ප්‍රකාරව මහා භාරකාරවයා හෝ ඔහු විසින් පත්කරනු ලබන පුද්ගලයෙකු විසින් භාරයන්වල ගිණුම් විගණනය කර, භාරයන් ප්‍රයෝජනයට ගනු ලබන සෑම පාර්ශවයක් වෙතම එකී ගිණුම් ලබාදිය යුතු වුවද, ආගමික හා සමාජසේවා පොදු භාර අරමුදල සම්බන්ධව එසේ කර නොතිබුණි.

**(iii)** මහා භාරකාර ආඥා පනතේ 43 වගන්තිය අනුව හඳුනාගත නොහැකි වර්ෂ 12 හෝ ඊට වඩා කාලයක් සමුච්චිත වී පවතින අරමුදල් රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවද යථෝක්ත භාරය සඳහා එසේ කර නොතිබුණි.

**(iv)** මෙම භාරය පිහිටුවා පවත්වාගෙන යාම නීතිවිරෝධී බැවින් එම භාරය අවලංගු කිරීම සම්බන්ධයෙන් 2015 සැප්තැම්බර් 03 දින මහා භාරකාරවරිය විසින් නීතිපතිවරයාගෙන් අදහස් විමසා තිබුණි. එහිදී මෙවැනි භාරයක් පිහිටුවීමට අධිකරණයෙන් අවසර ඉල්ලීමට නීතිමය බලයක් මහා භාරකාරතැනට නොමැති බව 2015 නොවැම්බර් 03 දින නීතිපති විසින් දන්වා තිබුණි. නීතිපතිවරයාගේ මතය අනුව යථෝක්ත භාර අරමුදලෙහි නීත්‍යානුකූල තත්ත්වය අධිකරණයට ඉදිරිපත් කර මෙම භාරය සම්බන්ධයෙන් අධිකරණ නියෝගයක් ලබා ගැනීමට 2016 දෙසැම්බර් 31 දින වන විටත් දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි.

**(v)** යථෝක්ත භාරය නමින් 2010 වර්ෂයේ දී රු.10,000,000 ක් හා 2012 වර්ෂයේදී රු.5,000,000 ක් ආයෝජනය කර තිබුණු අතර, එම ආයෝජන සඳහා පොලී ආදායම් ලෙස 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා රු.5,090,415 ක් ද, වෙනත් ආදායම් ලෙස රු.13,311,344 ක් ද, පොදු ආයෝජන පොලී ගිණුමට බැරවිය යුතු ආදායම රු.81,567,732 ක් ද මෙම කාලපරිච්ඡේදයට අදාළව ආගමික හා සමාජසේවා පොදු භාරයට බැර කර තිබුණි. ඒ අනුව එකතුව රු.99,969,491 ක ආදායමක් මෙම භාරයට ලැබී තිබුණි. ආගමික සමාජ සේවා හා පොදු භාර අරමුදලෙහි අරමුණු ඉටුකිරීම සඳහා ඉහත මුදල් භාවිතා කරමින් 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය වන විට රු.412,183,640 ක් වැය කර භාරයෙහි අවාසිදායක ශේෂයක් ඇති වන පරිදි වියදම් කර තිබුණි. එසේම භාර ඔප්පුවේ සඳහන් අරමුණුවලට පටහැනි පුණ්‍ය කටයුතු නොවන සේවක වැටුප්, ගමන් වියදම්, ඉන්ධන වියදම් හා සුභසාධන වියදම් වැනි වියදම් සඳහා වර්ෂ පහක් තුළ රු.46,352,238 ක් වැය කර තිබුණි.

(ආ) **අධිකාර බලය නොමැති වූ ගනුදෙනු**

**-----------------------------------------**

**නාරාහේන්පිට ශ්‍රී අභයාරාම විහාරස්ථානයට වන්දි මුදල් ගෙවීම**

**--------------------------------------------------------------------**

තිඹිරිගස්යාය මාර්ගය පුළුල් කිරීම වෙනුවෙන් උක්ත විහාරස්ථානයේ ඉඩම්, මාර්ග සංවර්ධන අධිකාරියට පවරාගෙන තිබූ අතර ඒ වෙනුවෙන් රු.33,360,000 ක වන්දික් 2007 සහ 2008 වර්ෂවලදී මහා භාරකාරවරයා වෙත ලබා දී තිබුණි. එම වන්දි මුදලෙන් කොටසක් වූ රු.15,000,000 ක් නැවත ඉදිකිරීම් සහ සංවර්ධන කටයුතු සඳහා යැයි දක්වමින් ශ්‍රී අභයාරාම විහාරස්ථානයේ විහාරවාසී හිමිනමකගේ ඉල්ලීමට අනුව 2007 දෙසැම්බර් 06 දින දී එම ස්වාමීන් වහන්සේ වෙත මහා භාරකාර දෙපාර්තමේන්තුව විසින් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** හිටපු මහා භාරකාර තැන විසින් 1931 අංක 19 දරන බෞද්ධ විහාර දේවාලගම් පනතේ 21 හා 25 වගන්තිවල සඳහන් පරිදි බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමැතිය ලබා නොගෙන නාරාහේන්පිට ශ්‍රී අභයාරාම විහාරස්ථානයේ විහාරාධිපති හිමියන් නොවන හිමිනමක් වෙත රු.15,000,000 ක් වූ වන්දියක් ගෙවා තිබුණි.

**(ii)** ඉහත වන්දි මුදල් නිදහස් කිරීම වෙනුවෙන් විහාරස්ථානයේ සංවර්ධන කටයුතුවලට අදාළ වියදම් ඇස්තමේන්තු, ඉංජිනේරු ඇස්තමේන්තු, ඉංජිනේරු සැලැසුම් යනාදී ලියවිලි බෞද්ධ කටයුතු කොමසාරිස් වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**(iii)** මෙම වන්දි මුදල් යොදා විහාරස්ථානයේ සංවර්ධන කාර්යයන් සිදුකළ බව තහවුරු කිරීම සඳහා කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් කර නොතිබූ අතර සිදුකරනු ලැබූ කාර්යයන් සම්බන්ධයෙන් කිසිදු පරීක්ෂාවක් හෝ පසුවිපරම් කටයුතු හිටපු මහා භාරකාරවරයා විසින් සිදුකර බව තහවුරු කෙරෙන සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(iv)** වන්දි මුදල් ස්ථාවර තැන්පතුවල ආයෝජනයෙන් 2015 පෙබරවාරි 09 දින වන විට පොලී ලෙස රු.24,876,740 ක් ලැබී තිබුණි. නමුත් රු.34,108,952 ක් විහාරවාසී හිමියන් වෙත නීත්‍යානුකූල නොවන රු.9,232,212 ක ගෙවීමක් කර තිබුණි. එසේම විහාරස්ථානයේ සංවර්ධන කටයුතු නොවන නඩු කටයුතු වෙනුවෙන් වූ නීතිඥ ගාස්තු සඳහා රු.339,000 ක් එම විහාරවාසී හිමියන් වෙත ගෙවා තිබුණි. ඒ සඳහා දෙපාර්තමේන්තුවේ වෙනත් භාර අරමුදල් හා බුදල්වල අරමුදල් භාවිතා කර තිබුණි

**(v)** මෙම විෂයගත කරුණට අදාළ එකතුව රු.1,750,000 ක් වූ ගෙවීම් වවුචර් අනුමත කිරීම හා සහතික කිරීම යන කාර්යයන් දෙකම මුදල් රෙගුලාසි 136 හා 137 හි සඳහන් පරිදි අභ්‍යන්තර පරීක්ෂාව කෙරෙහි අවධානය යොමු නොකර හිටපු මහා භාරකාරවරයා විසින් ගෙවීම් කර තිබුණි.

**3.9** **කළමනාකරණ දුර්වලතා**

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

**(අ)** **විදේශ වන්දි ගෙවීම් විගණනය**

1988 අංක 61 දරන සංශෝධිත මහා භාරකාර ආඥාපනතේ 10 (අ) වගන්තියට අනුව, විදේශ රැකියාවක නියුක්තව සිට විවිධ හේතූන් නිසා මිය යන සේවා නියුක්තිකයන් වෙනුවෙන් ලැබෙන වන්දි මුදල්, නොගෙවූ වැටුප් හා වේතන ආදිය නීත්‍යානුකූල උරුමකරුවන් අතර බෙදා දීම මහා භාරකාර දෙපාර්තමේන්තුවේ කාර්යභාරයක් වී තිබුණි. 2010 වර්ෂයේ සිට විගණිත දිනය වූ 2016 නොවැම්බර් 30 දින දක්වා කාලය තුළ විදේශ වන්දි 79 කට අදාළ එකතුව රු.98,415,465 ක් හා ඇමරිකානු ඩොලර් 93,936 ක් නොගෙවා ඉතිරි කර තිබුණි. මේ සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේ දී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**(i)** විදේශ වන්දි මුදල් නිදහස් නොකිරීමට හේතු ලෙස, හිමිකරුවන් තහවුරු කර ගැනීම සඳහා නඩු පවරා තිබීම, වන්දිවලට අදාළ හිමිකරුවන්ගේ තොරතුරු හැර චෙක්පත් පමණක් විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් දෙපාර්තමේන්තුව වෙත ලැබීම හා හිමිකරුවන් හඳුනා නොගැනීම නිසා දෙපාර්තමේන්තුවේ රඳවාගෙන තිබීම යන කරුණු සඳහන් කර තිබුණි. නමුත් එම කරුණු පිළිබඳව විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් හෝ අදාළ ප්‍රාදේශීය ලේකම් කාරයාලවලින් විමසා අදාළ හිමිකරුවන් වෙත වන්දි නිදහස් කිරීමේ ක්‍රමවත් හා කාර්යක්ෂම වැඩ පිළිවෙලක් දෙපාර්තමේන්තුව විසින් සිදු කර නොතිබුණි.

**(ii)** අවස්ථා 8 ක දී එකතුව රු.14,853,617 ක් වූ වන්දි මුදල් පමණක් ආයෝජනය කර තිබුණු අතර, අනෙකුත් වන්දි මුදල් භාර හා බූදල්වලට අයත් පොදු බැංකු ගිණුමෙහි රඳවා තැබීම හේතුවෙන් එම මුදල් දෙපාර්තමේන්තුවේ වෙනත් අරමුණු කරා යෙදවීමට හැකියාව පැවැතුණි. එමෙන්ම වන්දි මුදල් අදාළ හිමිකරුවන්ට ගෙවීමට නොහැකි වීම පිළිබඳ අවදානමක් ද පවතින බව නිරීක්ෂණය විය. විවිධ අවස්ථාවල විගණන විමසුම් මගින් මේ සම්බන්ධයෙන් හෙළිදරව් කර තිබුණ ද පවතින ක්‍රමවේදය නිවැරදි කර වන්දි මුදල් ආයෝජනය කර ඒ මත උපලබ්ධි වන පොලී ප්‍රතිලාභ වන්දි හිමියාට ලබාදිය හැකි ක්‍රමවේදයක් සකස් කිරීමට හා වන්දි ගෙවීම කාර්යක්ෂම කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

**(iii)** විදේශ වන්දි සම්බන්ධයෙන් කටයුතු කිරීම දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ කාර්යයක් වන අතර, දෙපාර්තමේන්තුවේ සතුටුදායක නොවූ මූල්‍ය පාලනය හේතුවෙන් විදේශ වන්දි සම්බන්ධයෙන් වෙනම ගිණුමක් පවත්වා නොතිබුණි. විගණනය සඳහා අවසාන වරට ඉදිරිපත් කළ 2015 වර්ෂයේදී භාර අවසාන ගිණුම්වල විදේශ වන්දි ලැබීම්, ගෙවීම් හා ගෙවිය යුතු ප්‍රමාණයන් හෙළිදරව් කර නොතිබුණි.

**(ආ)** **සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ කොටස් ආයෝජනය පිළිබඳ විගණනය**

1973 අංක 28 දරන සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම් (විශේෂ විධිවිධාන) පනත මගින් ලේක්හවුස් ආයතනය රජයට පවරා ගැනීමේ දී රජය වෙනුවෙන් කොටස් දැරීම සඳහා මහා භාරකාරවරයා නම් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** විගණනය සඳහා ලබාදුන් 2009 පෙබරවාරි 06 දිනැති කොටස් සහතිකය අනුව රජය වෙනුවෙන් මහා භාරකාරවරයා දරන, සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ සාමාන්‍ය කොටස් ප්‍රමාණය 3,050,379 ක් ලෙස දක්වා තිබුණද, එක් එක් වර්ෂය වෙනුවෙන් ලාභාංශ නිකුත් කරනු ලබන අවස්ථාවේ දී ඒ ඒ වර්ෂයට සටහන් කරනු ලබන කොටස් ගණන 1989 වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වා 3,050,448 සිට 3,050,380 දක්වා ක්‍රමයෙන් අඩු වී තිබුණි.

**(ii)** 1984 වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වා ලැබී ඇති එකතුව රු.102,001,336 ක ලාභාංශ ඒ ඒ වර්ෂයේ දී චෙක්පත් මගින් මහා භාණ්ඩාගාරය වෙත යවා ඇති බව සඳහන් වුවද, එම මුදල් ලද බවට භාණ්ඩාගාරයෙන් සනාථ කිරීම් ලබා ගෙන නොතිබුණි.

**(iii)** 1973 අංක 28 දරන සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම් (විශේෂ විධිවිධාන) පනතේ 12 ඡේදයේ සඳහන් මහා භාරකාරවරයා සතු බලතල අනුව ආයතනයේ ගැටළු සම්බන්ධව රජය වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට ලිඛිත නියෝග ලබාදිය හැකි වුවත්, එම බලතල ක්‍රියාත්මක කරමින් ආයතනයේ ලාභ උපරිම කිරීම, අනාර්ථික වියදම් අවම කිරීම, අනෙකුත් සුභසාධන කටයුතු යනාදිය සම්බන්ධ ඍජු මැදිහත් වීම් කර නොතිබුණි.

**(iv)** මහා භාරකාර දෙපාර්තමේන්තුව එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ විශාලතම කොටස් හිමියා වුව ද ඒ සම්බන්ධව දෙපාර්තමේන්තුවේ භාර බූදල් ගිණුම්වල හෝ කිසිදු හෙළිදරව් කිරීමක් කර නොතිබුණි.

**(ඇ)** **හැරී හපුගොඩ බූදලය**
**-----------------------**

1949 මාර්තු 29 දිනැති අංක 133 දරන හැරී හපුගොඩ මහතාගේ අන්තිම කැමති පත්‍රය හා 1953 ජූලි 24 දිනැති ගාල්ල දිසා අධිකරණයේ අංක T/8509 දරන ප්‍රොබේට් බලපත්‍රය ප්‍රකාරව හැරී හපුගොඩ මහතාගේ බූදලය සඳහා භාරකරු වශයෙන් මහා භාරකාර තැන නම් කර තිබුණි. ඒ අනුව හැරී හපුගොඩ මහතාට එවකට අයිතිව තිබූ හා අයිති වෙතැයි බලාපොරොත්තු වන සියලු නිශ්චල හා චංචල දේපළ සඳහා මහා භාරකාරවරයා භාරකරුවන සේම බූදල්කරුගේ අන්තිම කැමති පත්‍රය ප්‍රකාරව එහි සඳහන් අරමුණු ඉටු කිරීමේ වගකීම මහා භාරකාර තැන වෙත පැවරී තිබුණි. මේ සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි පරීක්ෂාවේ දී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** අදිරියන් අල්විස් හපුගොඩ නම් වූ හැරී හපුගොඩ මහතාගේ සහෝදරයාගේ 1936 සැප්තැම්බර් 15 දිනැති අංක 35197 දරන අන්තිම කැමති පත්‍රය ප්‍රකාරව ඔහුගේ බූදලය තම සොහොයුරු හැරී හපුගොඩ මහතාට හිමිවී තිබුණි. අදිරියන් අල්විස් හපුගොඩ මහතාගේ අන්තිම කැමති පත්‍රයට අනුව හැරී හපුගොඩ මහතා විවාහයක් නොමැතිව මිය ගියහොත් ඔහුගේ බූදලය බෞද්ධ කටයුතු ප්‍රවර්ධනය සහ උන්නතිය සඳහා පරම විඥානාර්ථ බෞද්ධ සමිතියට හිමිවිය යුතුය. එසේ වුවත් පරම විඥානාර්ථ බෞද්ධ සමිතියේ හිමිකාරත්වය පිළිබඳ තොරතුරු දෙපාර්තමේන්තු ගොනුවලට අනුව තහවුරු නොවූ අතර හැරී හපුගොඩ මහතාගේ අන්තිම කැමති පත්‍රය ප්‍රකාරව බූදලයේ අයිතිය මහා භාරකාර තැන වෙත පැවරී තිබුණි.

**(ii)** හැරී හපුගොඩ බූදලයට අයත් ගාල්ල මහා නගර සභා සීමා තුළ ශ්‍රී හේමානන්ද මාවතේ පිහිටි පර්චස් 3 ක ඉඩම් කොටස, ගොඩනැගිල්ල හා එහි පිහිටි සියලු දේ ව්‍යාපාර කටයුතු සඳහා වසර 5 ක කාලයකට 2012 ජනවාරි 01 දින බදු ඔප්පුවක් මගින් පුද්ගලයකුට බදු දී

තිබුණි. බදු දුන් දේපළෙහි මාසික බදු කුලිය රු.750 ක් වූ අතර දේපළ වසර 5 කට වරක් තක්සේරු කළ යුතු වුවත්, දේපළෙහි විධිමත් තක්සේරුවකින් තොරව මාසික බදු මුදල රු.750 ලෙස තීරණය කර තිබුණි.

**(iii)** බූදලයට අයත් නොබෙදූ ඉඩම්වල බෙදුම් කටයුතු සිදුකර අයිතිය තහවුරු කර එම ඉඩම් සුදුසු පරිදි වගා කටයුතු සඳහා යෙදවීම, බදු දීම වැනි ඵලදායී කාර්යයක් සඳහා යෙදවීම කෙරෙහි දෙපාර්තමේන්තුවේ අවධානය යොමු කර නොතිබුණි.

**(iv)** දෙපාර්තමේන්තුව විසින් 2014 හා 2015 වර්ෂවල දී මෙම බූදලයෙන් පිළිවෙලින් රු.21,000 ක් සහ රු.36,000 ක් ශිෂ්‍යාධාර ගෙවා තිබුණි. එහෙත් 2016 වර්ෂයේදී ශිෂ්‍යාධාර ගෙවීමට කටයුතු කර නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේදී බූදල්කරුගේ අරමුණු දෙපාර්තමේන්තුව විසින් ඉටු කර නොතිබුණි.

**(v)** බූදල්කරුගේ අන්තිම කැමති පත්‍ර ප්‍රකාරව සෑම වසරක දීම බූදලයේ ආදායමින් 1/5 ක් ඉතිරි කළ යුතු බවත් එම ඉතිරිය රු.100,000 වූ විට එය ශිෂ්‍යාධාර පිරිනැමීමට හා ආපදා තත්ත්වයන්හි දී සහන සැලසීමට රැස් කර තැබිය යුතු බවත් සඳහන් කර තිබුණි. එසේ වුවත්, බූදලයේ එම අරමුණු ඉටු කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් ආදායම් ඉතිරි කර නොතිබුණි.

**(vi)** බූදලයට අයත් සුදුවැලිපොත වත්තේ සේවය කර සේවය අවසන් වූ සේවකයන් තිදෙනෙකුට නියමිත දිනට පාරිතෝෂික නොගෙවීම නිසා රු.70,680 ක අධිභාර ගෙවීමට සිදුවී තිබූ අතර බූදලයට අයත් මත්තක වත්තේ සේවකයන්ට 2015 වර්ෂයට අදාළ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් නියමිත දිනට නොගෙවීම නිසා අධිභාර ලෙස රු.2,993 ක් ගෙවීමට සිදුවී තිබුණි.

**(vii)** 1949 මාර්තු 29 දිනැති අංක 133 දරන අන්තිම කැමති පත්‍රය හා 1953 ජූලි 24 දිනැති ප්‍රොබේට් බලපත්‍රය ප්‍රකාරව මහා භාරකාර තැන වෙත බූදලය පැවරී තිබුණත්, දේපළ සම්බන්ධයෙන් වන නීතිමය කටයුතු විගණන දින වන විටත් අවසන් කර නොතිබීම නිසා දිගින් දිගටම නීති ගාස්තු ගෙවීමට සිදුව තිබුණු අතර 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා එකතුව රු.69,775 ක නීතිඥ ගාස්තු ගෙවා තිබුණි.

**(ඇ)** **ජී.එස්. ජයසූරිය බූදලය**

**------------------------**

නුගේගොඩ, රේමන්ඩ් පාරේ අංක 49 දරන ස්ථානයෙහි පදිංචිව සිට 1982 අප්‍රේල් 08 දින මියගිය ජී.එස්. ජයසූරිය මහතාගේ බූදලයෙහි කටයුතු කිරීම සඳහා 1980 සැප්තැම්බර් 20 දිනැති අංක 472 දරන අන්තිම කැමති පත්‍රයේ අංක 505 දරන කොඩිසිල් පත්‍රය මගින් ශ්‍රී ලංකාවේ මහා භාරකාරවරයා වෙත තැන්පත් කර තිබුණු අතර, ඒ සඳහා ගල්කිස්ස දිසා අධිකරණයේ අංක 744/ටී දරන නඩුවේ 1982 නොවැම්බර් 09 දිනැති ප්‍රොබේට් බලපත්‍රය මගින් මියගිය තැනැත්තාගේ සියලුම දේපළ සහ බූදලය, අයිතිවාසිකම් සහ අයවිය යුතු ණය පිළිබඳ නම් කරන ලද පොල්මඃකරු ලෙස ශ්‍රී ලංකාවේ මහා භාරකාර තැන නීත්‍යානුකූලව පත්කර තිබුණි. "ජෝර්ජ ස්ටෙෆන් ජයසූරිය භාරය " ස්ථාපනය කර භාරයේ මූලික ප්‍රාග්ධන වශයෙන් බූදලයට අදාළ ආයෝජන මුදල් කිරීමෙන් සහ වත්කම් විකිණීමෙන් ලැබෙන මුදල් යොදවාගෙන භාරයේ අරමුණු ඉටුකළ යුතු බව අන්තිම කැමති පත්‍රය හා කොඩිසිල් පත්‍රය මගින් දක්වා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** 1980 සැප්තැම්බර් 20 දිනැති අංක 472 දරන අන්තිම කැමති පත්‍රය මගින්, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට පවරාගෙන තිබුණු මාදම්පේ සෙම්බුකට්ටිය වත්ත සහ දික්ඔය පොයිස්ටන් වත්ත වෙනුවෙන් ලැබුණු වන්දි මුදල් ද සමාගම් 4 ක කොටස් අලෙවියෙන් ලද මුදල හෝ එම කොටස්වලින් ලැබෙන ලාභාංශ ආදායම් ද "ජෝර්ජ ස්ටෙෆන් ජයසූරිය භාරයට" පවරා තිබුණ ද එකී වත්කම් භාරයට ලැබුණු බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොවිය.

**(ii)** සමාගම්වල කොටස් ප්‍රාග්ධනයේ ආයෝජන වෙනුවෙන් ලාභාංශ ආදායම් ලැබී නොමැති බව භාරයේ ගිණුම් පරීක්ෂා කිරීමේ දී නිරීක්ෂණය වූ අතර, ලාභාංශ ආදායම් ලබාගැනීම සඳහා පසුවිපරම් කටයුතු ක්‍රියාත්මක කිරීමට ද පියවර ගෙන නොතිබුණි.

**(iii)** රත්මලාන ලේඩි කැතරින් වත්ත ඉඩම් කැබැල්ල, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට පවරා ගැනීම වෙනුවෙන් ලැබිය යුතු වන්දි මුදලේ අයිතිය සම්බන්ධයෙන් අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පැවැතුණි. එම දේපළේ භාරකාරීත්වය මහ භාරකාරවරයා වෙත පැවරී වර්ෂ 36 ක කාලයක් ගතවී තිබුණ ද, දේපළේ අයිතිය තහවුරු කිරීමට අදාළ අධිකරණයට ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් නොකිරීම හා නඩු කටයුතු සඳහා කාර්යක්ෂම ලෙස මැදිහත් නොවීම හේතුවෙන් අයිතිය තහවුරු කර ගැනීමට හැකිවී නොතිබුණි. එහෙත් මෙම නඩු කටයුතු සඳහා 2000 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා නීතිඥ ගාස්තු වශයෙන් රු.1,413,650 ක් භාරයේ අරමුදලින් ගෙවා තිබුණි.

**(iv)** බුදුලයේ පැවති සියලුම වත්කම් හා දේපළ වලින් ලැබිය යුතු මුදල් හෝ ආදායම් රැස්කර ගැනීමේ දී, පැවැති කළමනාකරණ අකාර්යක්ෂමතාවයන් හේතුවෙන් අරමුදල් භාරයේ අරමුණු ඉටුකිරීමට නොහැකිවී තිබුණි.

## 3.10 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 06 | 04 | 02 |
| (ii) | තෘතියික මට්ටම | 02 | - | 02 |
| (iii) | ද්විතීයික මට්ටම | 59 | 50 | 09 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 17 | 13 | 04 |
| | **එකතුව** | **84** | **67** | **17** |